XXXXX


# අධ්‍යාපන අමාත්‍යාංශය
# கல்வி அமைச்சு
# Ministry of Education

'ඉසුරුපාය', බත්තරමුල්ල, ශ්‍රී ලංකාව.
'இசுருபாய', பத்தரமுல்ல, இலங்கை.
'Isurupaya', Battaramulla, Sri Lanka.
+94112785141-50 +94112785818
info@moe.gov.lk www.moe.gov.lk


මගේ යොමුව / எனது இல. / My Ref. ED/02/29/15/09

ඔබේ යොමුව / உமது இல. / Your Ref.

දිනය / திகதி / Date 2018.

……………………

…………………..

**ආසන අංකය XXXX**

මහත්මයාණෙනි/මහත්මියණි/මෙනවියනි,

**<u>දිවයිනේ ජාතික හා පළාත් පාසල්වල දහතුන් වසරක සහතික කරන ලද අධ්‍යාපන වැඩසටහන යටතේ වෘත්තීය විෂයයන් සඳහා සිංහල හා දෙමළ මාධ්‍යය ගුරු පුරප්පාඩු සඳහා ශ්‍රී ලංකා ගුරු සේවයේ 3-1(අ) ශ්‍රේණියට උපාධිධාරීන් බඳවා ගැනීම - 2018</u>**

ඉහත කරුණ සම්බන්ධයෙන් ප්‍රසිද්ධ කරන ලද අංක 2045 හා 2017.11.10 දිනැති ගැසට් නිවේදය අනුව 2018.03.10 දින විභාග කොමසාරිස් ජනරාල් විසින් පවත්වන ලද ලිඛිත පරීක්ෂණයේ හා අධ්‍යාපන අමාත්‍යාංශය මගින් පවත්වන ලද ප්‍රායෝගික පරීක්ෂණයේ ලකුණු වල එකතුවේ ප්‍රමුඛතාව අනුව **XXXXXXXX** විෂයය සිංහල මාධ්‍යය ගුරු පත්වීමක් ලබාදීම සඳහා ඔබ තෝරා ගෙන ඇති බව සතුටින් දන්වා සිටිමි.

02. ගරු අග්‍රාමාත්‍ය රනිල් වික්‍රමසිංහ මැතිතුමාගේ ප්‍රධානත්වයෙන්, ගරු අධ්‍යාපන අමාත්‍ය අකිල විරාජ් කාරියවසම් මැතිතුමාගේ සහ ගරු අධ්‍යාපන රාජ්‍ය අමාත්‍ය වි.රාධක්‍රිෂ්ණන් මැතිතුමාගේ සහභාගීත්වයෙන් **2018 ජූලි මස 20 වෙනි දින අරලිය ගහ මන්දිරයේ දී** ඔබට එම පත්වීම් ලිපිය ප්‍රදානය සිදු කරනු ලැබේ.

03. මෙම උත්සවයට සහභාගී වීම සඳහා ඔබ **එදින පෙ.ව. 9.30ට මෙම ලිපිය සහ ජාතික හැඳුනුම්පත රැගෙන** ගංගාරාම විහාරස්ථානය (බේරේ වැව) අසල පිහිටි ඇතුළුවීමේ දොරටුවෙන් **<u>පමණක්</u>** අරලිය ගහ මන්දිරයේ ප්‍රධාන ශාලාව වෙත ප්‍රවිශ්ට විය යුතු වේ.

04. පිරිමි පත්වීම්ලාභීන් කළු කලිසම, සුදු කමිසය හා ටයි පටියක් පැළඳිය යුතු අතර කාන්තා පත්වීම්ලාභීන් ලා පැහැයෙන් යුතු සාරියකින් හෝ ඔසරියකින් සැරසී පැමිණිය යුතුය.

05. **ඔබට ලබාදී ඇති අංකය අනිවාර්යයෙන්ම ඇඳුමේ වම් පස ඉහළින් පැළඳිය** යුතු අතර පත්වීම් ප්‍රදාන උත්සවයේ කටයුතු අවසන් වනතුරු ශාලාවේ රැදී සිටිය යුතු බවද කාරුණිකව දන්වා සිටිමි.

06. මෙම උත්සවය සඳහා පත්වීම්ලාභීන් පමණක් සහභාගී වියයුතු අතර වෙනත් කිසිදු පුද්ගලයෙකු උත්සව ශාලාව වෙත රැගෙන යාමට අවසර දෙනු නොලැබේ.

07. මේ සඳහා ගමන් වියදම් හෝ වෙනත් දීමනා කිසිවක් ගෙවනු නොලැබේ.

මෙයට - විශ්වාසී,

කේ.ජී.විජේසිරි
ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම්
(ගුරු ආයතන)

අ/කළේ . සුනිල් හෙට්ටිආරච්චි
ලේකම්
අධ්‍යාපන අමාත්‍යාංශය